2025.09.25

සියළුම ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරුන් සහ කතෘවරුන් වෙත,

**විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ වත්කම්, බැරකම් ප්‍රකාශ සම්බන්ධවයි**

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා තම වත්කම් බැරකම් ප්‍රකාශ ලබා නොදුන් බවට පවසමින්, ජාමුණි කමල් තුෂාර නැමැත්තෙකු අද (25) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් භාරදී තිබේ.

ඔහු සිදුකර ඇති මෙම චෝදනාව සම්පූර්ණයෙන්ම පදනම් විරහිත වන අතර, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ වත්කම් බැරකම් ප්‍රකාශය පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලයට ලැබුණු බවට වූ 2025.04.23 දිනැති ලිපිය පාර්ලිමේන්තු මහලේකම් කුෂානි රෝහණධීර මහත්මියගේ අත්සනින් යුතුව සජිත් ප්‍රේමදාස මහතා වෙත ලැබී තිබූ බව, අප මීට පෙර මාධ්‍යයට හෙළිදරව් කරන ලදී.

සජිත් ප්‍රේමදාස මහතා නියමිත දිනයටත් පෙර ලබාදුන් වත්කම් බැරකම් ලේඛණය ඩිජිටල් ආකෘතිය අනුව යළි පුරවා ඊයේ (24) දිනයේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදුව මේ වනවිටත්, එය එම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර තිබේ.

එවැනි තත්ත්වයක් තිබියදී යළිත් මේ ආකාරයෙන් සජිත් ප්‍රේමදාස මහතා වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදී නොමැති බව පවසමින්, පිරිසක් මඩ ගැසීමේ ව්‍යාපාරයක නිරතවන බව පෙනී යන අතර, කරුණාකර මේ පිළිබඳ නිවැරදි තොරතුරු සඳහා ඔබගේ මාධ්‍ය තුළ පුළුල් ප්‍රචාරයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින්නෙමු.

ස්තුතියි,

විපක්ෂ නායක මාධ්‍ය ඒකකය

සමගි ජන බලවේගය, නො. 592, බංගලා හන්දිය, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.
ஐக்கிய மக்கள் சக்தி, இல. 592, பங்களா சந்தி, கோட்டே வீதி, பிடகோட்டே.
Samagi Jana Balawegaya, No. 592, Bangala Junction, Kotte Road, Pitakotte.
+94 11 287 0211 / +94 11287 0212 +94 11287 8440 generalsecretarysjb@gmail.com